## සමන් ලෙනින්. ඔහු සැබෑ ගායකයෙකි



විශාල ආටෝපයක් නොතිබුණ නමුත් තදින් හිතට වැදුණ ප්‍රසංගයක් ඔක්තෝබර් 26 වන දා වික්ටෝරියාවේ සන්ෂයින්හිදී නරඹන්න ලැබුණා. ප්‍රසංගය සමන් ලෙනින්ගෙ ඒක පුද්ගල ප්‍රසංගයයි.

අපි හැමදාම දැකලා දැකලා අප්පිරියා වෙන්න ඔන්න මෙන්න ඉන්න බරසාර මහා කලා ශිල්පීන්ගේ දැවැන්ත ප්‍රසංග අතර සමන් ලෙනින් කියන පුංචි මිනිහා ඉදිරිපත් කළ ප්‍රසංගය කැපී පෙනුණා.

"අනේ මං ලංකාවෙදිවත් මේ වගේ ප්‍රසංගයක් තනිවම කරලා නැහැ" ඔහු කියද්දි ප්‍රසංගය නැරඹූ ප්‍රේක්ෂකයන් අත්පොළසන් දුන්නේ ඒ නිර්ව්‍යාජ කමටයි.

ඉතා දැවැන්ත පරාසයක ගායනා කිරීමේ හැකියාවක් ඇති සමන් ගේ හැකියාව පිළිබඳ බොහෝ දේ ලියන්නට හැකි වුණත් මම ඒ වෙනුවට ඔහු මේ ප්‍රසංගය පුරාවට පෙන්වූ සැබෑ මානුෂික ගුණාංග පිළිබඳ ලියන්නට කැමතියි.

සිය ජීවිතය මහා අගාධයකට ඇද දමමින් අවුරුදු ගණනාවකට පෙර තමා හැර ගිය පෙම්වතියට වෛර නොකරන ඔහු ලංකාවේ සිටින සිය දයාබර බිරිඳට ඇහෙන්නට අත්පොළසමක් දෙන්නැයි ප්‍රේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටි හැටි අපූරුයි.

සමන් ඇතුළු පිරිස මෙපුරට ගෙන්වන්ට මූලික වුණ හෙළ මාත්‍රා සංවිධානයේ මධු නානායක්කාරටත් සමන් ගේ ප්‍රසංගය සංවිධානය කරන්නට මූලික වුණ හේමමාලි බණ්ඩාරනායකටත් අපේ ආදරය පුද කරන්න මේ අවස්ථාව යොදාගන්නම්. ආදායම පිළිබඳ බරපතල අවධානමක් තිබුණත් වැදගත් වැඩකට අත දාන ඔබ වගේ අය අපට අවශ්‍යයි. සමන්ගේ ගුරු පියාණන් වන සමන් පනාපිටිය මහතාටත් අපේ ගෞරවය හිමිවෙනවා.

ගොර සපුන් ඇහැරෙන ඇඳිරියේ
දොළ හඬන තුං මං හන්දියේ
කවුරු එනතුරු මග බලනවද
මෝහිණී මගේ නංගියේ

සමන්ගේ ප්‍රබල හඬ මට තාමත් ඇහෙනව.

දුහුල් වළා ගලා බසින
කොළඹ අහස නිසංසළයි

ඇත්ත. ඒත් ඔබ අර ශාලාවෙ රැස්වෙලා හිටපු ගණනින් දෙසීයකටත් අඩු වාසනාවන්ත රසික පිරිසගෙ හදවත් සසළ කළා.

සුබ ගමන් නාඳුනන මිත්‍රයා. දවසක හමුවෙමු.

## අනේ එපා... එපා.. එපාා....



සමන් ලෙනින්ගෙ ප්‍රසංගය අතරතුරදි නිවේදන කටයුතු කළ අපේ හිතවත් පැතුම් තිලකසිරි එක්තරා නිවේදනයක් තුන් වතාවක් කළා.

"ප්‍රසංගය වීඩියෝ කලාට කමක් නැහැ. ඒත් ඔබ පිටුපසින් ඉන්නා ප්‍රේක්ෂකයන්ට අවහිර වන ලෙස ඒක කරන්න එපා"

අපට වැටහුණ විදිහට තුන් වතාවක්ම ඒ නිවේදනය කළේ විශාල ටැබ්ලට් පරිගණක වලින් වීඩියෝ කරමින් හිටිය කීපදෙනකු ඒ ඉල්ලීම නොසළකා හැරපු නිසයි. ශාලාවේ පිටුපසින්ම හිටපු අපට අර දුරකතන හා ටැබ්ලට් වලින් වීඩියෝ කරමින් හිටිය මහත්වරුන්ට පසුපසින් වාඩි වී සිටි අය මුහුණ දුන් අපහසුතාව හොඳින් පෙනුනා.

මටත් වතාවක් මේ අත්දැකීම ලැබුණා. ඒ ඇඩිලේඩ් නගරයෙදි. ජැක්සන් ඇන්තනිගෙ ප්‍රසංගයෙදි. එදා ශාලාවෙ මට ඉදිරිපේලියේ වාඩි වී සිටි කුඩා දරුවකු ප්‍රංසංගයේ මුලු කාලය පුරාම විශාල ටැබ්ලට් පරිගණකයකින් වීඩියෝ ක්‍රීඩා කරමින් හිටියා. එයින් නික්මුණ ආලෝකය හරියටම ඔහුට පිටුපසින් සිටි මගේ ඇහැට ඇති කළ පීඩාව අපමණයි. ඒ පීඩාව නිසාම මට එදා මුලු ප්‍රසංගයම රස විඳින්න බැරි වුණා. අදත් ඒ ප්‍රසංගය ගැන මට මතක තියෙන්නෙ අර ටැබ්ලට් එකෙන් නිකුත් වුණ ආලෝකය විතරයි. අර දරුවා ළඟ වාඩි වී සිටි ඔහුගේ පියා හෝ මව හෝ අනෙක් අය ගැන පොඩ්ඩක් කල්පනා කළා නම්.

කෙනෙක් මුදල් ගෙවා ප්‍රසංගයක් බලන්න යන්නෙ එය නිදහසේ රස විඳින්නයි. ඒ රස වින්දනයට බාධා වන ලෙස පිටුපසට ආලෝකය නිකුත් වන ජංගම දුරකතන හා ටැබ්ලට් උපකරණ වලින් වීඩියෝ කිරීම හරිම අසාධාරණයි. පොඩ්ඩක් අනිත් අය ගැනත් හිතන්න. ඔබ වගේම ඒ අයත් මේ ඇවිත් ඉන්නෙ ප්‍රසංගයක් රස විඳින්නයි. එයට බාධා වන දෙයක් නොකර ඉන්න එක ඔබේ යුතුකමක්. මනුස්සකමට නිශ්ෂබ්දව හිටියට හැමෝම ඉන්නෙ ඔබට හිතෙන් බැණ වදිමින්.

ඔබට වීඩියෝ කරන්නටම අවශ්‍ය නම් අන් අයට බාධා නොවන ලෙස ශාලාවේ පසුපසම ආසන පේලියට ගොස් වීඩියෝ කරන්න. එවිට කාගෙවත් ඇස් වලට ඔබේ උපකරණයේ ආලෝකය වැටෙන්නෙ නැහැනෙ.

# කතාබහ

ජගත් ජේ එදිරිසිංහ

## මුතු



රූපවාහිනී මුතුහර මෙල්බන් ළමා සමාජය දොරට වැඩුම පසුගිය දා ග්ලැඩ්ස්ටන්පාක් හිදී පැවැත්වුණා.

"මුතු දසන් පපා හිනැහී
මුතු අකුරු කියා පැහැදී" කියා අපේ හිතවත් සිසිර දිසානායක ලියූ ගීපද වලින් කියැවුණා සේම මේ දරු පැටවුන් මුතු කැට වගේම බැබලුණා.

විශාල ප්‍රශංසාවක් හිමිවෙන්න ඕනෙ මේ කාර්යය පිටුපස හිටිය වත්සලා ඉෂ්ඨවීර සොයුරිය ඇතුළු දැමාපිය පිරිවරට. ඔවුන්ගේ කැපවීම නොවන්නට මෙවන් ළමා සමාජයක් බිහි නොවන්නට ඉඩතිබුණා. ඔවුන්ට අපේ පැසසුම හිමිවෙනවා.

දරුවන්ගේ පෞරුෂ වර්ධනය උදෙසා සුවිසල් මෙහෙවරක් කළ හැකි මෙවන් ළමා සමාජ තව තවත් අපේ සමාජයට අවශ්‍ය යි. ඒ වෙනුවෙන් ඇප කැප වී වැඩ කරන පිරිසට අපේ ගෞරවය හිමිවෙන්නෙ ඒ නිසයි.

## කලු සුදු ගැන තවත් ටිකක්



ගිය මාසයේ කතා බහට ලිව්ව "කලු සුදු බණ" ගැන බොහෝ දෙනෙක් ප්‍රතිචාර දැක්වුවා. බොහෝ තැන් වලින් නොදැනුවත්ව කෙරෙන මේ වරද ගැන දැනුම්වත්වීම පිළිබඳව ඒ හැමටම ස්තුතියි. අපට අවශ්‍ය කිසිවකුට දොස් කීම නෙවෙයි. වරද නිවැරදි වෙනවා දැකීමයි.

මේ කතාවටම අදාල වන සිංහල වෙළඳ දැන්වීමක් අද මට දකින්න ලැබුණා. දැන්වීම හදල තියෙන්නෙ ස්කයි එන්ටර්ටේන්මන්ට්ස් කියන ආයතනයක්. අධ්‍යක්ෂණය කරලා තියෙන්නෙ උදය ධර්මවර්ධන කියලා මොලෝ මොළයක් නැති මිනිහෙක්. (මොළයක් තියෙනවා නම් මෙවැනි දැන්වීම් හදන්නෙ නැහැ) මැලිබන් අයතනයේ බිස්කට් වර්ගයක් වෙනුවෙනුයි වෙළඳ දැන්වීම හදලා තියෙන්නෙ. රඟපාන්නෙ විජය නන්දසිරි කියන ප්‍රවීණ රංගන ශිල්පියා.

මනමාලයෙක් මනමාලියක් බලන්න යනවා කපුවෙක් එක්ක. ගිහින් මනමාලි කලුයි කියලා ඒ අහිංසක මනමාලිව ප්‍රතික්ෂෙප කරනවා. මනමාලිගෙ නංගි සුදු නිසා එයාට නම් කැමතියි කියනවා.

මේ වෙළඳ දැන්වීම් හදන මිනිසුන් මේ කරන්නෙ කොයි තරම් කෲර වැඩක්ද කියලා මේ මිනිසුන්ගෙ මොළේට නොවැටහීම හරිම කණගාටුදායක තත්වයක්. ඔස්ට්‍රේලියාවෙදි නම් මේවට කියන්නෙ "ඩිස්ක්‍රිමිනේෂන්ස්" කියලා. හදපු මිනිහට නඩු දාලා හිරේ යවන්නත් පුවන්. ඒත් ලංකාවේ මේ වගේ අශික්ෂිත වෙළඳ දැන්වීම කිසිම වාරණයක් නැතිව එළියට එනවා.

තරුණියකගේ සම කලු වූ පමණින් ඇය සමාජයෙන් කොන් කර දැමිය යුතුද. එසේ කිරීම යුක්ති සහගතද? මෙවැනි දැන්වීම් බලන කලු හමක් ඇති තරුණියන්ට මොනවා නොහිතෙයිද? කලු සමක් ඇති තරුණියන් ලස්සන නැතැයි මතයක් සමාජ ගත කරන්නට මේ මිනිසුන් මේ තරම් වෙහෙසෙන්නෙ ඇයි? ඒවට හිනාවෙන - ඒවා අනුමත කරන අයත් ඉන්නවද?

මේ වගේ සමාජ අසාධාරණ කතා කියන රඟපෑම් වලට විජය නන්දසිරි ප්‍රසිද්ධයි. ඔහු කීප වතාවක් ටෙලි නාට්‍ය වලදි විවිධ නිළි චරිත හැඳින්වීම සඳහා "කලු - කොට - කැත - තාර පීප්පයක් වගේ" වැනි වචන පාවිච්චි කරනවා මම දැකලා තියෙනවා. ප්‍රවීණ නලුවකු වශයෙන් පිටපතේ ඇති මෙවැනි සමාජ විරෝධී යෙදුම් වලට විරෝධය දක්වන්න ඔහුට හැකියාව තිබිය යුතුයි. අධ්‍යක්ෂවරයා කියන ඕනෙම දේකට මුදල් නිසා එකඟ වන විජය න්නදසිරිලා තවත් වතාවක් මේවා ගැන කල්පනා කරනවා නම් ඒක සමාජයට කරන විශාල මෙහෙයක්.

කිසිම කලා නිර්මාණයකින් මිනිසුන්ගේ ශාරීරික පැහැය ශාරීරික දුබලතා අදහන ආගම වැනි දේ උපහාසයට ලක් කළ යුතු නැහැ. එවැනි දේ වෙනස් ලෙස සැළකීම් හෙවත් ඩිස්ක්‍රිමිනේෂන් ලෙසයි සැළකෙන්නෙ. අපේ ටෙලි නාට්‍ය වල අසන්න ලැබෙන "අත කොට මිනිහා කොටා ගොලුවා ගොතයා බතලයා මිට්ටා" වැනි වචන හරිම අප්‍රසන්නයි. මේ මෑතදී විකාශය වුණ එක ටෙලි නාට්‍යයක කලු පැහැති ශරීරයක් තියෙන මිටි පුද්ගලයෙක් පෙන්වා "කවුද මේ කාලගෝලයා" කියලා අහන දෙබසක් තිබුණා මට මතකයි. එවැනි පුද්ගලයන් ගේ අනුගමනය කරමින් ඔවුන් උපහාසයට ලක්වන ආකාරයට කරන රංගනත් අප්‍රසන්නයි.

මිනිසුන් මේ ආකාරයට උපහාසයට අපහාසයට ලක් කිරීම ශ්‍රී ලංකාවේදි ඉතාම සුලු කොට සැළකීම මට තේරුම් ගන්න බැහැ. ඔවුන්ට ඒක ඉතාම සුලු දෙයක්. ඒ නිසානෙ අර වගේ දැන්වීම් වලට අනුමැතිය ලැබෙන්නෙ.

"මේ දැන්වීම බැලුවට පස්සෙ මම මැලිබන් බිස්කට් කන එක නැවැත්තුවා" ෆේස්බුක් පිටුවක රසිකයෙක් ලියලා තිබුණා. මෙවන් දැන්වීමකට අනුමැතිය දුන්න එම සමාගම ඒ වරදට දඬුවමක් විඳින්නම ඕනෙම තමයි.

## පහන් සන්ධ්වනිය පිළිබඳ පහන් හැඟීමෙන්



යුරෝක් දහම් නිකේතනයට ආධාර පිණිස පැවැත්වුණ පහන් සන්ධවනි ප්‍රසංගය නරඹද්දි දැනුණ අදහස් කීපයක් ඔබ සමග බෙදා හදා ගන්න හිතුවා. මෙල්බන් නගරයේ බොහෝ ප්‍රසංගය නරඹා ඇති අපේ හිතවතුනට සම්පූර්ණයෙන්ම කුඩා දරු දැරියන් පිරිසකගෙන් නිමැවුණ සංගීත කණ්ඩායමක් සහිත ප්‍රසංගයක් කියන්නෙ අලුත්ම අත්දැකීමක්. මෙවන් ප්‍රසංගයක් සඳහා දරුවන් දැරියන් පුරුදු පුහුණු කරවන කාර්යයේදී දෙමාපියන් කොයි තරම් කැපවීමක් කළාද කියන එක අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. ඔබට ඔබේ දරුවන් ගැන ආඩම්බර විය හැකියි. ඔවුන් ඒ තරම්ම දක්ෂයි.

මේ ගැන කතා කරද්දි අමතකම කරන්න බැරි පුද්ගලයෙක් තමයි මේ දරුවන්ට ශිල්පය ලබා දුන් ගුරුවරයා. ඔහු අසංක ගගහගෙදර. ඔහු මේ දරුවන්ට සංගීතඥානය ලබා දුන්නා පමණක් නෙවෙයි. සිංහල සුභාවිත ගීතයට මේ දරුවන්ගේ සවන් හරවන්නටත් ඔහුට හැකි වෙලා තියෙනවා. ඒක තමයි ඉතාමත්ම වැදගත් දේ. අසංක ගේ මග පෙන්වීම යටතේ මේ දරුවන් ගායනා කළේ සිංහල සුභාවිත ගීතයි. මෙරට හැදෙන දරුවන් සාමාන්‍ය සිංහල ගීයක් වත් අහන්නෙ නැති තත්වයක් යටතේදී ඔහු කළ මේ හපන්කම අපේ පැසසුමට හේතුවෙනවා.

කෝට්ටේ සන්තින්ද්‍රිය අපේ නායක හාමුදුරුවන් දේශනා කළ සේම මෙය මෙල්බන් ප්‍රසංග ඉතිහාසයේ සුවිශේෂීම අවස්ථාවක්.

එකම කරුණු කාරණා ටිකක් තුන් දෙනෙකුගේ හඬින් නැවත නැවත කියැවෙමින් කෙරුණ විනාඩි 45ක කතා සභාව කෙටි වුණා නම් ප්‍රසංගය තවත් හොඳයි.